**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2023**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය අනුව, පිරිවැය රු.451,545,750 ක්වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් භාවිත කළ හැකි තත්ත්වයේ තිබුණද එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ සුන්බුන් වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයේ දී සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ සුන්බුන් අගයන් 2023 වර්ෂයේදී සමාලෝචනය කරන ලද අතර සමාලෝචන ක්‍රියාවලිය 2024 පෙබරවාරි මස අවසන් කරන ලදී. එබැවින් ප්‍රමිතියට අනුව ගිණුම්කරණ ගැලපීම 2024 වර්ෂයේ සිට සිදු කළ හැක. | සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ සුන්බුන් වටිනාකම සමාලෝචනය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදයට පටහැනිව, මිලදී ගත් වර්ෂයේ මුළු වර්ෂය සඳහාම ක්ෂයවීම් ගණනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ බැහැර කළ වත්කම් වර්ෂය සඳහා ක්ෂයවීම් ගණනය කර නොතිබුණි. | එකඟ වේ.<br>ඒ අනුව අදාළ ගිණුම් ගැලපීම් සිදු කෙරේ. | අදාළ ගිණුම් වල ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ බදුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද රු.10,721,715 ක ආපසු ගෙවනු ලබන තැන්පතු අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ගණනය කිරීමට පෙර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දැ ශේෂයෙන් අඩු කරනු වෙනුවට අඩමාන ණය ප්‍රතිපාදනවල වටිනාකමෙන් අඩු කර තිබුණි. තවද, ණයගැති ගිණුම්වල ඇතුළත් රු.5,196,786 ක් වූ බැර ශේෂයන්, අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ගණනය කිරීමේදී ණය ගැතියන්ගෙන් සහ ලැබිය යුතු ශේෂයෙන් අඩු කර තිබුණි. ඒ අනුව, අඩමාන ණය සඳහා ප්‍රතිපාදන අඩුවෙන් දක්වා තිබුණි. | වෙළඳ ණයගැති ගිණුම්වල අදාළ නිවැරදි කිරීම් 2024 මූල්‍ය වර්ෂයේදී සිදු කෙරේ. | ණය ගැතියන්ගේ බොල් ණය ප්‍රතිපාදන, ආපසු ගෙවනු ලබන තැන්පතු සහ බැර ශේෂය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම පෙන්විය යුතු අතර ඒවා හිලව් නොකළ යුතුය . |
| (ආ) | වර්ෂය තුළදී රු.46,313,360 ක් වටිනා මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය විදුලි ස්ථාපන ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරු කර සියයට 20 ක අනුපාතයකින් | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | මේ සම්බන්ධයෙන් ගිණුම්වල හෙළිදරව් කිරීමක් |

| | | | |
|---|---|---|---|
| | ක්ෂය කර තිබුණි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් ගිණුම්වල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | | සිදු කළ යුතුය. |
| (ඇ) | යාල සහ පාසිකුඩා සංචාරක සංවර්ධන කලාපවල රු.328,000,000 ක වටිනාකමින් යුත් ඉඩම් කැබලි කිහිපයක් සමාලෝචිත වර්ෂයේදී ආයෝජන දේපල ලෙස නැවත වර්ගීකරණය කර තිබුණි. මෙම මුදල දෙවරක් අදාළ ගිණුම්වල ගැලපීම් සිදු කර තිබුණු බැවින්, ආයෝජන දේපල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර ඉඩම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ නිවැරදි කිරීම 2024 මුදල් වර්ෂය තුළ සිදු කරන ලදී. | ජර්නල් සටහනට අනුව 2024 වර්ෂය සඳහා ගිණුම් නිවැරදි කර එවැනි දෝෂ මගහරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පාසිකුඩා, බෙන්තොට සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලද තානායම්වල ඉඩම්වලට අදාළ ආයෝජන දේපල ගිණුමේ ශේෂය සහ ඉඩම් ලේඛනයට අනුව එම ඉඩම්වල වටිනාකම අතර රු.325,675,000 ක සම්පූර්ණ වෙනසක් නිරීක්ෂණය විය. එබැවින් ආයෝජන දේපල සහ ප්‍රත්‍යාගණන ලාභය මෙම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ නිවැරදි කිරීම 2024 මුදල් වර්ෂය තුළ සිදු කරන ලදී. | ජර්නල් සටහන් වලට අනුව 2024 වර්ෂය සඳහා ගිණුම් නිවැරදි කර එවැනි දෝෂ මගහරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | නිවැරදි ස්ථාවර තැන්පතු පොළිය රු.214,818,648 ක් වුවද එය රු.101,941,103 ක් ලෙස රු.112,877,545 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. තවද රු.1,368,750,000 ක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම වෙනුවට රු.1,250,000,000 ක් ලෙස රු.118,750,000 ක් අඩුවෙන් සහ ලැබිය යුතු පොළිය රු.255,736 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. එසේම ස්ථාවර තැන්පතු පොළිය මත රඳවා ගැනීමේ බද්ද රු.13,135,042 ක් ගිණුම්ගත කර නොතිබීම නිසා ආදායම් බදු වියදම ද ඉහළ ගොස් තිබිණි . | නැවත ආයෝජනය නොකර "අරමුදල් කළමනාකරණ ඉතිරි කිරීමේ ගිණුමට" පොළිය මාරු කරන ලෙස බැංකුවට උපදෙස් දී ඇත. කෙසේ වෙතත්, බැංකුව උපදෙස් පිළිනොපැදීම හේතුවෙන් එහි වෙනස සිදු විය. | බැංකු තහවුරු කිරීම අනුව 2024 වර්ෂය සඳහා ගිණුම් නිවැරදි කර එවැනි දෝෂ මගහරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1. 5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු දෑ | 42,104,132 | 38,473,520 | 3,630,612 | | ශේෂයන් වරින් වර සංසන්දනය කළ යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයෙන් ලැබිය යුතු දෑ | 9,957,640 | - | 9,957,640 | මෙම වෙනස්කම් සංසන්දනය කරමින් පවතින අතර ඒ අනුව ගිණුම් පොත්වල නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | |
| (ඇ) | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවිය යුතු දෑ | 6,512,810 | 243,528,033 | 237,015,223 | | |
| (ඈ) | සංචාරක සංවර්ධන අරමුදලින් ලැබිය යුතු දෑ | 408,683,267 | 342,574,074 | 66,109,193 | මෙම ඇස්තමේන්තු දෝෂය 2024 මූල්‍ය වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 25 ක් වූ වෙළඳ ණය ගැතියන් රු.70,008,231 ක් වසර 03 කට වැඩි කාලයක් තිස්සේ ආපසු අයකර ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ ජනරාල් විසින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මූල්‍ය කළමනාකරණ, නීති, සංවර්ධන සහ අනෙකුත් විශේෂ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. | ණයගැති කාලය තුළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කල් ඉකුත් වූ ණය ගැතියන් සඳහා අධිභාරයක් පැනවිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුළු විවිධ ණය ගැතියන්ගෙන් සියයට 91 ක් වූ විවිධ ණය ගැතියන් රු.5,668,578 ක් වසර 04 කට වැඩි කාලයක් තිස්සේ අයකර ගෙන නොතිබුණි. තවද, විවිධ | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර මෙම ශේෂයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | ණයගැති කාලය තුළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කල් ඉකුත් වූ ණයගැතියන් සඳහා |

| | | | |
|---|---|---|---|
| | ණයගැතියන් තුළ රු.559,961 ක නොපියවූ ආරම්භක ශේෂයක් තිබුණි . | | අධිභාරයක් පැනවිය යුතුය. |
| (ඇ) | සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් විදේශීය සංචාරකයන් හට ප්‍රවාහන පහසුකම් ලබාදෙන ත්‍රී රෝද රථ රියදුරන් සඳහා ආරම්භ කරන ලද “ටුක් ටුක් වැඩසටහන” වෙනුවෙන් වැයවන මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වී තිබුණු නමුත්, 2018 සහ 2019 වර්ෂයන්හි දරා තිබුණු රු.13,227,648 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අය වී නොතිබුණි. | පුහුණු වැඩසටහන් සඳහා දක්වා ඇති එම මුදල ගිණුම් පොත්වලින් කපා හැරීමට අදාළ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලා ඇත. | 2024 වර්ෂයේදී ශේෂය අයකර ගැනීමට/ කපා හැරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | 2019 වසරේ නිවාඩු නිකේතනයකින් ලැබුණු රු.200,000 ක චෙක්පතක් අඟරු වී තිබුණද ණයගැති ශේෂය නැවත ඇති නොකර ගිණුම්වල අඟරු චෙක්පත් ලෙස තබා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේ. | ණයගැති ශේෂය යථා තත්ත්වයට පත් කර ඉක්මනින් ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට තානායම් 34 කින් අයවිය යුතු හිඟ කුලී ආදායමේ එකතු වටිනාකම රු.29,831,815 ක් විය. ඉන් වසර 4 කට වැඩි හිඟහිටි කුලී ආදායම රු.10,167,445 ක් හෝ සියයට 34 ක් වුවද, එම මුදල් අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොවුණි. එමෙන්ම, වර්ෂ 04 කට වැඩි කාලයක් තිස්සේ පුරප්පාඩු වූ තානායම් 07 ක් බදු දීමට මේ දක්වාත් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ කුලී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | වසා දැමූ බෙන්තොට වෙළඳසැල්වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.989,826 ක් වූ ලැබිය යුතු ශේෂය වසර 07 කට වැඩි කාලයක් තිස්සේ අයකර ගෙන නොතිබුණි. | ණය එකතු කිරීමේ කමිටුවේ නිර්දේශය අනුව, නිසි අනුමත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අදාළ ගිණුමෙන් ණයගැති ශේෂයන් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | ණයගැති ශේෂය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පීසීආර් හා රක්ෂණ සේවා සැපයුම්කරුවන් සඳහා ගෙවිය යුතු රු.179,654,720 ක් මේ දක්වා පියවීමට කටයුතු කර නොතිබුණි. තවද, ඉහත ශේෂය පිළිබඳ වයස් විශ්ලේෂණයක් ලැබී නොතිබුණි. | සේවා සපයන්නන් වෙත ගෙවිය යුතු මුදලක් නොමැති බවත් ගනුදෙනුවල ස්වභාවය සැලකිල්ලට ගනිමින් මෙම "පීසීආර් සහ ගෙවිය යුතු රක්ෂණ" ලෙජර් ගිණුමේ වයස් විශ්ලේෂණයක් සකස් කිරීම ප්‍රායෝගික නොවේ. එබැවින් ඔබගේ නිරීක්ෂණයට එකඟ නොවේ. | ගෙවිය යුතු මුදල නිරවුල් කර මෙය ආදායමක් ලෙස සැලකීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාසිකුඩා නිවාඩු නිකේතනයේ ජල සැපයුමට අදාළව ගෙවිය යුතු රු.67,195,229 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. තවද, ඉහත ශේෂය පිළිබඳ වයස් විශ්ලේෂණයක් ලැබී නොතිබුණි. | මෙම ශේෂය දැනට සංසන්දනය කරමින් පවතින අතර 2024 මුදල් වර්ෂය තුළ නිවැරදි කිරීම සිදු කරනු ඇත. | ශේෂය සංසන්දනය කර නිවැරදි කිරීම ඉකමනින් කළ යුතුය. |
| (ඇ) | රඳවා ගත් මුදල් රු.9,915,544 ක් වසර 05 කට වැඩි කාලයක් තිස්සේ පියවා නොතිබුණි. | විවිධ හේතුන් මත නවතා ඇති කොන්ත්‍රාත්තුවලට එම ශේෂයන් අදාළ වේ. | නවතා ඇති කොන්ත්‍රාත්තු සඳහා හේතු සොයා බැලීමට සමාලෝචනයක් කළ යුතු අතර ඒවා ආරම්භ කිරීමට නොහැකි වුවහොත් එම මුදල් කපා හැර ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත | | | |
| | (i) 6.1 (අ) සහ (ආ) වගන්ති | සංචාරක සංවර්ධනය සඳහා 2020 සිට 2024 දක්වා කාලය සඳහා යෝජිත දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්ම සකස් කර අමාත්‍යවරයා වෙත ලබා දී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | සංචාරක පනතට අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ii) වගන්තිය 26(3) | සංචාරක කලාප හඳුනාගෙන ප්‍රධාන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය අරඹා තිබුණද, එම ප්‍රදේශ ඇතුළත කරගෙන යාහැකි සංචාරක කටයුතු, වාණිජ්‍ය හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සකස් කර නොතිබුණි. | ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර සම්පත් හිඟකම හේතුවෙන් මෙම කාර්යය ප්‍රමාද වී ඇති අතර, මෙම කාර්යය සිදු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහය ලබා ගැනීමට උත්සාහ කරන අතර, එහිදී කලාප 5 ක් සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස සවිස්තරාත්මක රෙගුලාසි සහ මාර්ගෝපදේශ සකස් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මෙම කාරණය සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිචාරය අපි බලාපොරොත්තුවෙන් සිටිමු. | ප්‍රකාශිත කලාප තුළ කළ හැකි සංචාරක ක්‍රියාකාරකම්, වාණිජ සහ අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් රෙගුලාසි සකස් කළ යුතුය . |
| (iii) 48(4) වගන්තිය | • 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා කාලය තුළ හඳුනාගත් ලියාපදිංචි නොකළ ආයතන 504 කට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරියේ බලාත්මක කිරීමේ ඒකකය යෝජනා කළද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවශ්‍ය සාක්ෂි එකතු කිරීම තෙක් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාමට ආයතනය දැන් සූදානම්ය. පසුගිය වසර දෙකහමාරක කාලය තුළ පවා, ප්‍රධාන වශයෙන් රජයේ චක්‍රලේඛවල ප්‍රතිඵලයක් ලෙස සහ ස්ථාපිත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම හේතුවෙන් අධිකාරිය විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගැනීමෙන් වැළකී සිට ඇත. | ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. |
| | • නුවරඑළිය ප්‍රදේශයේ සංචාරක හෝටල් සහ ආපනශාලා 106 ක නියැදියකින් සියයට 62 ක් වන ආයතන 66 ක් අධිකාරිය යටතේ ලියාපදිංචි වී නොතිබුණි. සත්‍ය වශයෙන් ලියාපදිංචි වූ සංචාරක ආයතන සංඛ්‍යාව 81 ක් පමණක් වුවද, විදේශීය වෙබ් අඩවිවල ලියාපදිංචි වී ඇති සංචාරක ආයතන දහස් ගණනකට වඩා වැඩි ප්‍රමාණයක් තිබුණි. | විධිමත් අංශයට අවිධිමත් අංශයේ බලපෑම අවම කිරීම සඳහා වසර තුනක කාලයක් තුළ විශේෂ ඒකකයක් පිහිටුවීම සඳහා අධිකාරිය ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) සහාය ඉල්ලා සිටින ලදී. කෙසේ වෙතත්, තාවකාලික ප්‍රතිචාර හැරුණු විට, එම කාර්යය ඵලදායී ලෙස හැසිරවීමට අවශ්‍ය හැකියාව නීති අංශයට පවා නොමැත. තවද, අවිධිමත් අංශය තුළ ක්‍රියාකාරකම් | සංචාරකයින්ට සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය විසින් සංචාරක පොලිසියට ඇතැම් වගකීම් පවරා ඇත. | |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත (SOE) | | | |
| | (i) 2.3 ඡේදය | සියලුම රජය සතු ව්‍යවසායන් මෙම අත්පොතෙහි අදාළ විධිවිධානවලට අනුකූලව තමන්ගේම පරිපාලන සහ මූල්‍ය අත්පොත් සකස් කර ගැනීමට අවශ්‍ය වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. කෙසේ වෙතත්, මේ දක්වා අධිකාරිය විසින් පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර අනුමත කර නොතිබුණි . | මූල්‍ය අත්පොත සඳහා අදාළ දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව පත් කර ඇති අතර දැනට ලේඛන ඇගයීම් අදියරේ පවතී. පරිපාලන අත්පොත සඳහා උපදේශන සේවා වෙනුවෙන් නැවත කැඳවීම් කළ යුතුය. | අත්පොත් දෙක සකස් කිරීමට ඉක්මන් පියවර ගත යුතුය. |
| | (ii) 3.4 ඡේදය | අධිකාරිය අද දක්වා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි. | අනුප්‍රාප්තිකයින් හඳුනා ගැනීම අංශයේ ප්‍රධානියා සහ කාර්ය සාධනය මත ඉහළ කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන අතර, මෙම ක්‍රියාවලිය නිල වශයෙන් ලේඛනගත කිරීම හෝ සන්නිවේදනය කිරීම සිදු නොවේ. | අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශය විසින් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 චක්‍රලේඛය මඟින් සංශෝධනය කරන ලද මූල්‍ය රෙගුලාසි 371(2) (ආ) | අධිකාරිය විසින් 2023 වර්ෂයේදී දී මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරීන්ට තත්කාර්ය අතුරු අග්‍රිම එකතුව රු.7,571,560 ක් අවස්ථා 27 කදී ලබාදී තිබුණු අතර, එය රු.100,000 ක සීමාව ඉක්මවා තිබුණි. තවද, 2023 නොවැම්බර් 06 වන දින සෆාරි ජීප් රියදුරන් 960 දෙනෙකු සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනක් සඳහා ලබාගත් රු.2,432,000 ක තත්කාර්ය අතුරු අග්‍රිමය ද මෙතෙක් පියවීමට කටයුතු කර නොතිබුණි. | මුල් බිල්පත්වල විශ්වසනීයත්වයක් නොමැති වුවද, මුදල් අංශය සාකච්ඡා කරමින් පවතින අතර ඉතිරි සියයට 50 තවමත් නිකුත් කර නොමැත. | විධිමත් අනුමැතියකින් තොරව රු.100,000 ඉක්මවූ තත්කාර්ය අතුරු අග්‍රිම ලබා නොදිය යුතු අතර මුල් පිටපත් සහ විශ්වාසනීය බිල්පත් සහ ඉන්වොයිසි ඇති විට පමණක් පියවීම් සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.751,130,743 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.579,760,623 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.171,370,120 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අපගමන බදු ආදායම රු.247,812,538 කින් සහ සංචාරක සංවර්ධන බදු ආදායම රු.149,291,525 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 සහ 2019 වර්ෂවලදී යාල සංචාරක සංවර්ධන කලාපයේ අක්කර 35 ක භූමියක් සහ අක්කර 16.8 ක භූමියක් සමාගම් 7 ක් වෙත කල්බදු පදනමට ලබා දී තිබුණද, සමාගම් 7 න් සමාගම් 2 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ක්‍රියාකාරී තත්ත්වයෙන් කටයුතු කරමින් තිබුණි. මෙම තත්ත්වය තුළ අධිකාරිය විසින් ක්‍රියාකාරී නොවූ සමාගම්වලට එරෙහිව ඒවා ක්‍රියාකාරී නොවීම, බදු වාරික ගෙවා නොමැතිකම සහ කල් බදු ගිවිසුම අවසන් කිරීම සම්බන්ධයෙන් නඩු ගොනු කර තිබුණි. එමෙන්ම, බද්දට ගත් සමාගමක්ද කල් බදු ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව නඩු පවරා තිබුණි. මෙම සියලු නඩු සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීමකින් තොරව, පෞද්ගලික නීතිඥයින්ගෙන් සේවා ලබාගෙන රු.3,475,000 ක මුදලක් 2021 සහ 2022 වර්ෂවලදී නීති ගාස්තු ලෙස ගෙවා තිබුණි. | මෙම ආයෝජකයින් තිදෙනෙකු දැනටමත් හෝටල් ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී. එක් සමාගමක් 2024, 3 වන කාර්තුවෙහි ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. අනෙක් ආයෝජකයින් දෙදෙනාගෙන් එක් අයෙකු පසුගිය වසර 3 තුළ කිසිදු ප්‍රගතියක් නොමැතිව ඉදිකිරීම් කටයුතු වලින් සියයට 30 ක් සම්පූර්ණ කර ඇත. අධිකාරියේ ආයෝජක සබඳතා ඒකකය (IRU) හරහා නව නිර්මාණ සඳහා අනුමැතිය ලබා ගැනීම අධිකාරිය නැවත ආරම්භ කර ඇත. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධිකරණ නඩුව සඳහා පෞද්ගලික නීති සේවා ලබා ගන්නා ලදී. එසේම, පත් කරන ලද පෞද්ගලික නීතිඥයින් විසින් ලබා දුන් උපදෙස් මත 2020 ඔක්තෝබර් මාසයේදී අධිකාරිය විසින් කැබිනට් අනුමැතිය ලත් ආයෝජකයා සමඟ නව කල්බදු ගිවිසුමක් අත්සන් කර ඇත. | ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය හොඳින් අධීක්ෂණය කළ යුතු අතර මෙම සියලු නඩු කටයුතු සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබාගත යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 05 ක් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් රු.50,067,245 ක් සහ රු.51,269,048 | ඵලදායිතාව සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් කාර්යමණ්ඩල මාරුවක්, පාරිභෝගික මනාපයන් සපුරාලීම | ජාතික නිවාඩු නිකේතන ලාභ ලබන ආකාරයෙන් පවත්වාගෙන යාමට |

| | | | |
|---|---|---|---|
| | ක් ලෙස අලාභ ලබා තිබුණද, එම නිවාඩු නිකේතනවල අලාභය අවම කර ගැනීමට අධිකාරිය ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | සහ විකුණුම් වැඩි කිරීම සඳහා ආහාර වර්ග වෙනස් කිරීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් නිවාඩු නිකේතන කළමනාකරණ අංශය විසින් ක්‍රියාවට නංවා ඇති අතර පිරිසිදු හා වඩාත් සංවිධානාත්මක වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා 5S ක්‍රියාත්මක කිරීම ද ආරම්භ කරන ලදී. | කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සභාපති කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක විසින් ඉල්ලුම් කර තිබූ රු.1,072,102 ක් වටිනා ටෝනර් ලැබී නොතිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඒ පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. එසේ තිබියදී 2021 අගෝස්තු 05 වැනි දින අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට අනුයුක්තව සේවය කළ කාර්යාල කාර්ය සහායකයා සහ ඉහත කාර්යාල කාර්ය සහායක විසින් රු.1,234,540 ක් වටිනා ඡායා පිටපත් සහ ටෝනර් ගබඩාවලින් සොරකම් කර තිබුණි. අලුතින් මිල දී ගත් රු.198,500 ක් වටිනා ලැප්ටොප් පරිගණකය 2022 අගෝස්තු 24 දින නිවාඩු නිකේතන කළමනාකරණ අංශයේදී අස්ථානගත වී තිබුණි. ඒ අනුව, මූලික පැමිණිලි සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ ක්‍රියාකාරී මැදිහත් වීමක් නොමැතිකම හේතුවෙන් වංචාවන් දිගින් දිගටම සිදුවන පරිසරයක් අධිකාරිය තුළ නිර්මාණය වී තිබුණි. | අධිකාරියේ සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ, ගබඩාවල සිදුවූ ටෝනර් සහ ඡායා පිටපත් කඩදාසි සොරකම් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් දැනටමත් අධිකාරියේ විනය පරීක්ෂණයක් ආරම්භ කර අඛණ්ඩව සිදුවෙමින් පවතී. ඊට අමතරව අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී .<br>සිද්ධියෙන් පසුව, ප්‍රධාන වශයෙන් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ලෙස සීසීටීවී පද්ධතිය ශක්තිමත් කිරීම, වගකීම් පැවරීම, ආරක්ෂක නිලධාරීන්ට පුළුල් මාර්ගෝපදේශ නිකුත් කිරීම සිදු කරන ලදී.<br>නිවාඩු නිකේතන කළමනාකරණ අංශයේදී ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වීමේ සිද්ධිය සම්බන්ධයෙන් කොල්ලුපිටිය පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරන ලදී. නොසැලකිලිමත්කම මත වගකිව යුතු නිලධාරීන් සඳහා චෝදනා පත්‍ර නිකුත් කර විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇත. | සීසීටීවී පද්ධතිය නිරන්තරයෙන් සමාලෝචනය කිරීමට නිලධාරියකු පත් කිරීමට සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. තවද විනය පරීක්ෂණය පදනම් කරගෙන ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා බලාත්මක ඒකකය මඟින් සිදුකළ විමර්ශනයන්ට අනුව සංචාරක ව්‍යවසායන් හෝ සංචාරක සේවාවන් ලෙස ව්‍යාපාර කරගෙන යන ලියාපදිංචි නොකළ ආයතන 640 ක් හඳුනාගෙන | බලාත්මක කිරීමේ ඒකකය විසින් ලියාපදිංචි නොකළ ආයතන හඳුනාගෙන ඇති අතර, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට කරුණු කිහිපයක් බලපා ඇත. කෙසේ වෙතත්, ප්‍රමාණවත් | ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු නමුත් ඉන් ආයතන 20 ක් පමණක් 2022 ජූලි 03 දින වන විට ලියාපදිංචි කර තිබුණි. කළමනාකරණය විසින් මෙම ඒකකයේ කාර්යසාධනය පිළිබඳව ද ප්‍රමාණාත්මක ඇගයීමක් සිදුනොකර එම ඒකකයේ උපදේශක, විමර්ශන නිලධාරී සහ නීති උපදේශක වෙනුවෙන් දීමනා වශයෙන් පමණක් 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා එකතුව රු.13,397,500 ක් ගෙවීමට කටයුතු කර තිබුණි. | සාක්ෂි එකතු කිරීමේ අවශ්‍යතාවය හැර, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාමට කටයුතු කරමින් පවතී. | |
| (ආ) | පාසිකුඩා ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රය තුළ ස්ථාපිත හෝටල් හා ඊට සම්බන්ධ ආයතනවල මලද්‍රව්‍ය හා අපවහන ජලය පිරිසිදු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අධිකාරිය 2011 ජුනි 18 දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර පද්ධතිය නඩත්තු කර පවත්වා ගෙන යාම, පරිශ්‍රයේ පිහිටි හෝටල් 14 න් ගාස්තු අයකර ගැනීම සහ ඉහත පුද්ගලික සමාගමට එසේ අයකරගත් මුදල් ගෙවීම අධිකාරියේ වගකීමක් විය. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පර්චස් 118 ක ඉඩම අධිකාරිය විසින් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනට හෝටල් 14 න් අයවිය යුතු මුදල රු.412,765,334 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද ගිවිසුම ප්‍රකාරව ඉහත පෞද්ගලික සමාගමට ගෙවිය යුතු මුළු මුදල හෝටල් වලින් ලැබිය යුතු ප්‍රමාණය ද ඉක්මවමින් රු.421,113,524 ක් වී තිබුණි. 2021 අප්‍රේල් 20 දින, මෙම පද්ධතිය අධිකාරියට පවරා ගැනිමේ හැකියාව පිළිබඳව මූල්‍ය උපදේශනය ලබා ගැනීම සඳහා රු.1,644,750 ක් වූ පිරිවැයකට පෞද්ගලික අංශයේ බද්ධ ව්‍යාපාරයක් තෝරාගෙන එයට ප්‍රදාන ලිපිය නිකුත්කර තිබුණු නමුත් ඒ සම්බන්ධ අවසාන නිගමනයක් ද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ගෙන නොතිබුණි. | අවසන් වාර්තාව 2023 වර්ෂයේදී ලැබුණි. යන්ත්‍රාගාරය අධිකාරියට පවරා ගැනීමට වාර්තාවේ සහය නොදැක්වූ බැවින් වාර්තාවේ සොයාගැනීම් අභ්‍යන්තරව දීර්ඝ ලෙස සාකච්ඡා කර පසුව ලක්දියත සමඟ මෙන්ම සියලුම හෝටල් හිමිකරුවන් සමඟ සාකච්ඡා කර ක්‍රියාකාරී විසඳුමකට එළැඹුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ සියලු පාර්ශ්වයන් අතර අවසන් එකඟතාවයට පැමිණි අතර, එහිදී සේවා සපයන්නා වන ලක්දියත විසින් 2024 ජනවාරි 31 දිනට මුළු හිඟ මුදලින් සියයට 38 ක නිදහස් කිරීමක් ලබා දී රු.70,000,000 ක් වහා ගෙවීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලා සිටින ලදී. යන්ත්‍රාගාරය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගලපන ලද ශේෂය සහ ඉතිරි ශේෂය සමාන මාසික වාරික වශයෙන් ගෙවීමට වසර 3 ක (මාස 36) කාලයක් ලබා දෙන ලදී. තවද, 2024 පෙබරවාරි මාසයේ සිට, ඔවුන් මසකට රු.1,300,000 ක ස්ථාවර මුදලක් සහ ඝන මීටර් එකකට රු.75 ක විචල්‍ය පිරිවැයක් ලෙස මධ්‍යම අපද්‍රව්‍ය පවිත්‍රාගාර සේවා සඳහා ඉන්වොයිසියක් ලබා දීමට සහ හෝටල් වලින් තත්‍ය තොරතුරු මත ගාස්තු අය්කිරීමටත් එකඟ විය. ඉතිරි වසර 09 ක ගිවිසුම් කාලය සඳහා ලක්දියත සේවා අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත | අවසන් නිගමනයකට පැමිණ අධිකාරියට සිදුවන පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | . ඒ අනුව ලක්දියතට රු.70,000,000 ක් ගෙවා එකඟ වූ වෙනස්කම් අතිරේකයක් ලෙස පවතින ගිවිසුමට ඇතුළත් කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හෝටල් සමඟ ඇති තනි පුද්ගල ගිවිසුම්වලට එම නියමයන්ම අතිරේක වශයෙන් ඇතුළත් කිරීමට නීති අංශය කටයුතු කරමින් සිටී. | |
| (ඇ) | 2011 සහ 2014 වර්ෂවලදී අධිකාරිය විසින් කුච්චවෙලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා පවරා ගත් ඉඩම් අක්කර 510.086 ක් වූ භූමි ප්‍රමාණයෙන් 2020 වර්ෂය වනවිට ඉඩම් අක්කර 35 ක් පමණක් සමාගම් 2 කට බදු දී තිබුණු අතර 2021 මැයි මාසයේදී අක්කර 14 ක් තවත් සමාගමකට බදු දී තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් බදු දී තිබුණු සමාගම් 3 න් එක් සමාගමක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි. | ප්‍රකාශ කළ පරිදි අධිකාරිය සමඟ බදු ගිවිසුම්වලට එළඹී ඇති සමාගම් 3 ට අමතරව නව ආයෝජකයින් 3 දෙනෙකු සමඟ තවත් බදු ගිවිසුම් 3 කටද අධිකාරිය අත්සන් තැබීමෙන් මෙම ආයෝජකයින් හය දෙනා සඳහා අක්කර 79 ක් වෙන් කර ඇත. ඊට අමතරව නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් තවත් ආයෝජකයින් තිදෙනෙකුට තවත් ඉඩම් අක්කර 36 ක් ලබාදීමට අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඇත.<br>දැනට, එක් ආයෝජකයෙකු හෝටල් මෙහෙයුම්වල නියැලී සිටින අතර, ඔවුන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගත අනෙකුත් ආයෝජකයින් 5 දෙනෙකු සමඟ දිගටම සාකච්ඡා කර ඇතත්. මෙහිදී මතුවන ප්‍රධානතම ගැටලුව වන්නේ කුච්චවේලි වෙරළ ආශ්‍රිත නිකේතන ප්‍රදේශයට ජල සැපයුමක් නොමැතිකමයි. ඒ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් (NWSDB) ඉල්ලීමක් කර ඇත. | බදු ඉඩම් සඳහා දක්ෂ ආයෝජකයින් ගෙන්වා ගෙන මෙහෙයුම් කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. තවද, ආයෝජකයින්ට තම ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කිරීමට අත්‍යවශ්‍ය පහසුකම් සැලසිය යුතුය. |
| (ඇ) | සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් කල්පිටියේ දූපත් 12 ක ඉඩම් අක්කර 2056.73 ක භූමි ප්‍රමාණයක් 2010 සහ 2012 වර්ෂයන්වලදී අධිකාරියට ලැබී තිබුණි. එම දූපත් 12 න් දූපත් 10 කට අයත් ඉඩම් අක්කර 668.69 ක් පමණක් 2010, 2011, 2020 | ජල බංගලා සඳහා ආයෝජකයින්ට අදාළ අනුමැතිය නොලැබීම, ධීවර ප්‍රජාවගේ ගැටලුව, දූපත් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම යනාදී හේතු නිසා ව්‍යාපෘති ප්‍රමාද විය. 2023 මැයි මාසයේදී, අධිකාරිය | කල්බදු ලබාදීමට ඇති දූපත් සඳහා දක්ෂ ආයෝජකයින් ගෙන්වා ගැනීමටත්, අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා ඔවුන් සමඟ සහයෝගයෙන් |

| | | | |
|---|---|---|---|
| | සහ 2022 වර්ෂවලදී සමාගම් 07 ට බදු දීමට කටයුතු කර තිබුණු නමුත් එම කිසිදු සමාගමක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, අධිකාරිය විසින් කල්පිටියේ බදු දී ඇති දූපත් 10 කට අදාළ බදුකරුවන් හත් දෙනෙකුගෙන් 2018 සිට 2024 දක්වා අය විය යුතු බදු මුදල් රු.92,959,827 ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ආයෝජකයින් 4 දෙනෙකු සමඟ තවත් බදු ගිවිසුම් 4 ක් අත්සන් කර ඇත. කෙසේ වෙතත්, යටිතල පහසුකම් සීමා කිරීම් සහ අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන්, ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය බලාපොරොත්තු වූවාට වඩා මන්දගාමී වේ. | ක්‍රියා කිරීමටත්, කඩිනමින් මෙහෙයුම් ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 වර්ෂයේදී රු.61,000,000 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබුණද, මන්නාරමේ ඉඩමක අයිතිය අද දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි . | මන්නාරම තේමා නිකේතනයක් සංවර්ධනය කිරීම සඳහා අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා රු.61,000,000 ක් වූ මුදලක් මන්නාරම ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කරන ලදී. මේ වන විට 2 වන වගන්තියේ දැන්වීම ප්‍රකාශයට පත් කර ඇති අතර ඉඩමේ නිරවුල් බව සම්බන්ධ තක්සේරුව ද අවසන් කර ඇත. ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි මන්නාරම ප්‍රාදේශීය ලේකම් ඉදිරි කටයුතු පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා දී ඇත. මෙම කාරණය සිදුවෙමින් පවතින අතර, ඒ පිළිබඳව සමීපව පසු විපරම් කරමින් සිටිමු. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය පසු විපරම් කර ඉක්මනින් ඉඩම පවරා ගත යුතුය. |
| (ඊ) | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.39,227,275 ක් සහ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.12,264,582 ක් ලෙස වසර 04 කට පෙර ගෙවා ඇති අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම අත්තිකාරම් සංචාරක කලාප සංවර්ධන අත්තිකාරම් ගිණුමේ - 633 යටතේ ලබාගෙන දෙද්දුව ලේක් රිසෝට් ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් වූ බවට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් තහවුරු කිරීමේ ලිපි තවමත් අපට ලැබී නොමැති බැවින් මෙම ගිණුමේ එකතුව රු.1,109,000 ක ශේෂයක් ඉතිරිව ඇත. ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති ඒවා අවසන් වන තුරු ප්‍රාග්ධනීකරණය කළ නොහැක. අවසන් වූ පසු, | කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඒවා ඒ අනුව ප්‍රාග්ධනීකරණය කළ හැකිය. | |
| (ඇ) | 2018 ජුනි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මාස 18 ක් ඇතුළත සංචාරක සංවර්ධන කලාප 07 ක ප්‍රධාන සැලසුම් රු.39,151,500 ක මුළු පිරිවැයක් යටතේ සකස් කිරීම සඳහා අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) 2019 පෙබරවාරි 13 වැනි දින අවබෝධතා ගිවිසුමකට (MOU) එළැඹ තිබුණි. කෙසේ වෙතත්, අද වන විට පිළිවෙලින් 2020-2030 සහ 2021-2030 කාලසීමාවන් සඳහා ඇල්ල සහ ආරුගම්බේ සඳහා ප්‍රධාන සැලසුම් දෙකක් පමණක් සකස් කර තිබුණි. සැලසුම් 05 ක් සකස් කිරීම සඳහා රු.18,400,000 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. තවද ඉහත සැලසුම් තුළ ක්‍රියාකාරකම් සහ ඉලක්කවලට එරෙහිව නිශ්චිත කාල සීමාවක් ස්ථාපිත කර නොතිබුණ අතර මේ සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටුවක් අද දක්වා පත් කර නොතිබුණි. එහිදී එම සංචාරක ප්‍රදේශවල දීර්ඝ කාලයක් තිස්සේ යටිතල පහසුකම් සංවර්ධනය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | මාස 18 ක් ඇතුළත කලාප 7 කම වැඩ අවසන් කිරීමට මුලින් සැලසුම් කර තිබුණද, පාස්කු ඉරිදා ප්‍රහාරයත්, ඉන් පසුව ඇති වූ කොවිඩ්-19 වසංගතයත්, ඉන් අනතුරුව රට තුළ ඇති වූ ඉන්ධන/ආර්ථික/විදුලිය අර්බුදයත් හේතුවෙන් ප්‍රගතිය ප්‍රමාද විය. ඒ වගේම මේ ව්‍යාපෘතියේ කටයුතු කිරීමට පත්කළ UDA කණ්ඩායමේ වෙනස්කම් ද ඒ අතර විය. වර්තමානයේ මෙම ගැටළු බොහොමයක් විසඳා ඇති අතර 2025 මැද භාගය වන විට UDA හරහා එම කාර්යය අවසන් කිරීමට බලාපොරොත්තු වේ. එක් එක් සැලසුම් වල ක්‍රියාත්මක කිරීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ක්‍රියාමාර්ග පැහැදිලිව හඳුනා ගන්නා ලෙස UDA වෙත දැනුම් දී ඇත. එම සැලසුම්වලට අනුව ඉහත සඳහන් ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය නොකිරීමට ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රාග්ධන වියදම් සීමා කිරීම/ රඳවා තබා ගැනීම සහ ක්‍රියාත්මක කරන බොහෝ සංවිධානවල අරමුදල්/ මූල්‍ය හිඟය හේතු විය. UDA වෙත ගෙවීම් කිරීමේදී සිදු කරන ලද කාර්යය මත පමණක් ගෙවීම් කෙරේ. | සංචාරක සංවර්ධන ප්‍රධාන සැලසුම් කඩිනමින් සකස් කර අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අනුරාධපුර ජාතික නිවාඩු නිකේතනය මෑතකදී අලුත්වැඩියා කර තිබුණද, බිත්තිවල ජලය කාන්දු වීම, ගුණාත්මක බවින් අඩු නානකාමර උපාංග භාවිතය, හානි වූ දොරවල් සහ සිවිලිම ආදිය හේතුවෙන් එම ගොඩනැගිල්ලේ ප්‍රයෝජනවත් ආයු කාලය විගණනයේදී සහතික කළ නොහැකි විය. 2020 වසරේ සිට බහුකාර්ය තාක්ෂණ ශිල්පීන් නොමැතිකම හේතුවෙන් නිවාඩු නිකේතනයේ නඩත්තු කටයුතු | අනුරාධපුර නිවාඩු නිකේතනයේ පවතින නඩත්තු හා ගුණාත්මක ගැටළු ක්‍රමානුකූලව විසඳීමට සැලකිය යුතු පියවර ගෙන ඇත. නඩත්තු කටයුතු කාර්යක්ෂම ලෙස හැසිරවීම සඳහා බහුකාර්ය කාර්මික ශිල්පියෙකු බඳවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව මානව සම්පත් දෙපාර්තමේන්තුවට කිහිප වතාවක් දැනුම් දීම මෙයට | නිවාඩු නිකේතනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නඩත්තු ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| නිසියාකාරව සිදු කර නොතිබුණි. තවද, කාමර 52 ක් තිබුණද CCTV පද්ධතියක් සහ විදුලි ජනක යන්ත්‍රයක් මෙම නිවාඩු නිකේතනයේ ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවාඩු නිකේතනය ක්‍රියාත්මක කිරීමේදී රු.8,321,156 ක අලාභයක් සිදුවී තිබුණි. | ඇතුළත් වේ. අතිරේකව, නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා බාහිර පාර්ශ්වයක් බඳවා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර සමස්ත නඩත්තු ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට කැප වී ඇත. | |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේදී ඇතැම් හෝටල්, ආපනශාලා, සංචාරක ආයතන, බංගලා සහ ආගන්තුක නිවාස ලියාපදිංචි කිරීම නිශ්චිත මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන් බැහැර කරමින් සිදු කර තිබුණි. එහිදී, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ආයතනවල ප්‍රමිතිගත හා ගුණාත්මක පහසුකම් නොමැතිකම හේතුවෙන් ඒවා භාවිතා කරන සංචාරකයින් හෝ අමුත්තන් බොහෝ ගැටලුවලට මුහුණ දිය හැකි බව පෙනී යයි. | අදහස් දක්වා නොතිබුණි. | හෝටල් , ආපනශාලා, සංචාරක ආයතන, බංගලා සහ ආගන්තුක නිවාස ලියාපදිංචි කිරීම නිශ්චිත මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ගෙන් බැහැර නොවී සිදු කළ යුතුය. |
| (ආ) | බණ්ඩාරවෙල ජාතික නිවාඩු නිකේතනය අධිකාරිය යටතේ ලියාපදිංචි සහතිකය ලබාගෙන තිබුණද, එය ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණි. තවද මෙම නිවාඩු නිකේතනය නිසි ආකාරයෙන් නඩත්තු කර නොතිබුණි. ලැගුම්කුටි, මුළුතැන්ගෙය, ප්‍රධාන ගොඩනැඟිල්ලේ ලොබිය, ළමා උද්‍යානය සහ උද්‍යානය බොහෝ කාලයකින් අලුත්වැඩියා කර නොතිබුණි. ගෘහ භාණ්ඩ හා උපකරණ ද හානි වී භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. මෙමඟින් අධිකාරියට අයහපත් ප්‍රතිරූපයක් ඇති කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.3,198,422 ක අලාභයක් ලැබී තිබුණි. | බණ්ඩාරවෙල ජාතික නිවාඩු නිකේතනය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) යටතේ ලියාපදිංචි සහතිකයක් ලබාගෙන ඇති අතර, ලියාපදිංචිය සඳහා අත්‍යවශ්‍ය ඇතැම් අවශ්‍යතා තවමත් සපුරා නොමැති බව පෙනේ. මේ වන විට නිවාඩු නිකේතන කළමනාකරණ අංශය (වෙළඳ නිකේතන) සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මේ දක්වා නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය කිරීමෙන් ප්‍රමිතීන් නංවාලීම සඳහා CECB (මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය) වෙතින් සේවා ලබාගෙන ඇත. | නිවාඩු නිකේතනයේ ප්‍රමිතිය ඉහළ නංවා ලාභ ලබන ඒකකයක් බවට පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඇල්ල සංචාරක කලාපයේ ප්‍රධාන ස්ථානවල අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. රාවණා ඇල්ල ප්‍රදේශයේ | අදහස් දක්වා නොතිබුණි. | ඇල්ල සංචාරක සංවර්ධන ප්‍රදේශයේ පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය. |

විදුලි පහන්, සනීපාරක්ෂක පහසුකම් ආදී පහසුකම් සපුරා නොතිබුණි. තවද ඇල්ල දුම්රිය ස්ථානයේ ප්‍රමාණවත් ආසන පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, සංචාරකයින් සඳහා දුරකථන ආරෝපණය කිරීමේ ඒකකයක් සහ දුම්රිය කාලසටහන් ප්‍රදර්ශනය කර නොතිබුණි.

## 3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාල ජාතික වනෝද්‍යානය ආසන්නයේ පිහිටි නිකේතන ප්‍රදේශයේ පර්චස් 50 ක ඉඩමක් 2021 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ දිවියන් පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා පුද්ගලික සමාගමකට නොමිලේ ලබා දී තිබුණි. ගිවිසුම අත්සන් කිරීමේ සම්බන්ධිත පාර්ශව බැඳීම සහ පුද්ගලික සමාගම තෝරා ගැනීමේ ක්‍රමය පිළිබඳ විගණනයේදී ගැටලු සහගත බව නිරීක්ෂණය විය. | එකල ඉහත කී ‘දිවියන් පර්යේෂණ මධ්‍යස්ථානය’ සඳහා බදු ගිවිසුම අත්සන් කළ සභාපතිනිය එම ගිවිසුමට සම්බන්ධ පෞද්ගලික ආයතනයට සම්බන්ධ පාර්ශ්වයක් විය. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය පිළිබඳ මූලික සාකච්ඡා 2017 වසරේ ආරම්භ වූ අතර, 2017-2019 කාලසීමාව තුළ අවශ්‍ය සියලුම අනුමැතීන් ලබාගෙන ඇති අතර, එහිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් අනුමැතිය 2019 ඔක්තෝබර් මාසයේදී ප්‍රදානය කරන ලදී. එම කාලය තුල සභාපතිනිය කිසිඳු සම්බන්ධතාවයක් හෝ අධිකාරියේ කොටසක් නොවූ බැවින් මෙය සම්බන්ධිත පාර්ශව බැඳීමක් ලෙස නොසැලකිය යුතු වේ. | සම්බන්ධිත පාර්ශව බැඳීමක් සහිත ගනුදෙනු වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ විධිවිධානවලට පටහැනිව සංචාරක ආයතන ලියාපදිංචි කිරීමේ/අළුත් කිරීමේ සහතික අත්සන් කිරීමේ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලය 2023 අප්‍රේල් 27 දින අධ්‍යක්ෂ (ප්‍රමිති හා තත්ත්ව සහතික) වෙත පවරා තිබුණි. | 48(3) වගන්තිය සංචාරක ව්‍යවසාය වර්ගීකරණයන් මත අධිකාරිය සමඟ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කිරීම සඳහන් කරයි. ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමේ බලය මණ්ඩලයට පැවරී ඇත. එබැවින් මණ්ඩලය විසින් මෙම අධිකාරිය අධ්‍යක්ෂ SQA වෙත පවරා ඇත. අධ්‍යක්ෂ SQA වෙත අධිකාරිය පැවරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය පැවරීමේ ප්‍රතිපාදන පනතේ නොමැති බව සඳහන් කළ යුතුය. | මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය ලබා ගැනීම වඩාත් සුදුසු වේ. |

| | | | |
|---|---|---|---|
| | | කෙසේ වෙතත්, පනතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල පැවරීමේ ක්‍රියා පටිපාටිය ද දක්වා නැත. | |
| (ඇ) | සම්බන්ධිත පාර්ශව බැඳීමක් වළක්වා ගැනීම සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා 2019 නොවැම්බර් 05 දින සිට මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් බාහිරින් පත් කරගෙන තිබුණි. 2019 නොවැම්බර් 05 සිට 2023 දෙසැම්බර් 04 දක්වා රැස්වීමකට රු.94,500 බැගින් ලබා දී අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය පත් කර තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 05 සිට 2024 මාර්තු 04 දක්වා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර රැස්වීමකට රු.65,000 ක මුදලක් ගෙවීමේ පදනමට ලීගල් ඉන්ක් ආයතනය පත් කර තිබූ අතර මීට පෙර අනුගමනය නොකළ සංකල්පයක් වූ සභාපතිවරයාගේ ලේකම්ගේ සහාය ලීගල් ඉන්ක් ආයතනය වෙත ලබා දී තිබුණි. තවද, ලීගල් ඉන්ක් ආයතනය 2024 මාර්තු 01 දින සිට එක් රැස්වීමකට රු.135,000 බැගින් වසරක් සඳහා විධිමත් ලෙස පත් කර තිබුණි. ඊට ද සභාපතිවරයාගේ ලේකම්ගේ සහය ලබා දී තිබුණි. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.6 වගන්තියට පටහැනිව, අධිකාරියේ කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් රාජකාරි කටයුතුවලට මැදිහත් නොවී සම්බන්ධිත පාර්ශව බැඳීමක් වළක්වා ගැනීම සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ සභාපති ලෙස, ඉල්ලා සිටින සහය ලබා දීමට සුදුසුකම් සහිත විශ්වාසවන්ත සභාපතිගේ ලේකම්වරිය ලීගල් ඉන්ක් ආයතනය වෙත සහය වීමට පත් කර ඇති බව ඔබට දන්වා සිටීමට කැමැත්තෙමි. | මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද 2011 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.6 වගන්තියට පටහැනිව, අධිකාරියේ කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්යාල කටයුතුවලදී මැදිහත් නොවී, සම්බන්ධිත පාර්ශව බැඳීමක් වළක්වා ගැනීම සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

### 3.6 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු තානායම් 37 න් 9 ක් වර්ෂ දෙකේ සිට අට දක්වා කාල | අදහස් දක්වා නොතිබුණි. | ආයෝජන දේපල ඵලදායී ලෙස භාවිතා |

| | | | |
|---|---|---|---|
| | පරාසයකට බදු දී නොතිබුණු බැවින් එම දේපල ඌන උපයෝජිතව පැවතුණි. | | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගාල්ල දිස්ත්‍රික් ලේකම්ගේ අංක ඩීපීස්/එල්එන්ඩී/03/බීඒඑන්/පොදු සහ 2017 ජුනි 20 දිනැති ලිපිය පරිදි 2017 වර්ෂය වන විට රු. 173,159,909 ක් ගෙවා දෙද්දුව සංචාරක සංවර්ධන ව්‍යාපාතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිටත් එහි සංචාරක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | අගමැතිවරයා සහ සංචාරක අමාත්‍යාංශයේ රු.500,000,000 ක මුදලක් පළමු පියවරේදී ශ්‍රී ලංකාවට ලබා දිය යුතු බවට වූ කොන්දේසිය සපුරාලීමට නොහැකි වීම නිසා මැලේසියානු ව්‍යාපෘතිය අවලංගු කරන ලදී. එමෙන්ම, ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වන මායිම් නිරවුල් කර ගැනීම සහ ආක්‍රමණය වැළැක්වීම සඳහා අඛණ්ඩව කටයුතු කරමින් සිටී. | ආයෝජන දේපල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බිබිල තානායම පරිශ්‍රයේ ආක්‍රමණ සහ ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම හේතුවෙන් වසර 17 කට වැඩි කාලයක් තිස්සේ අතහැර දමා තිබුණි. එහිදී, 2016 නොවැම්බර් 02 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ආයෝජකයාගෙන් ලැබිය හැකිව තිබූ මුළු කුලී ආදායම රු.10,462,466 ක් සහ රු.40,000,000 ක ආයෝජනයක් අධිකාරියට අහිමි වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ආක්‍රමණය ඉවත් කර තානායමේ ආරක්ෂාව තහවුරු කළ යුතු අතර තානායම නිසි ලෙස බදු දීමට හෝ ඵලදායී ලෙස ලාභදායී ආකාරයෙන් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 1993 දී අධිකාරියට පවරන ලද රාගල තානායම 1998 දී පුද්ගලික පාර්ශවයකට මාසික කුලිය රු.5,167 බැගින් බදු දී තිබූණු අතර 2001 සිට සමුච්චිත කුලිය බදුකරු විසින් ගෙවා නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව රු.697,546 ක් කපා හැර තිබුණි. 2010 වසරේදී මෙම පරිශ්‍රය ආක්‍රමණයකට ලක්ව තිබුණු අතර තානායමේ ආරක්ෂාවද අවදානමට ලක්ව තිබුණි. මේ අතර 2022 දී ආක්‍රමණිකයින් ඉවත් කිරීමට අධිකරණ නියෝගයක් ලැබී තිබුණද, 2023 නොවැම්බර් 23 දින විගණනය මඟින් සිදු කරන ලද භෞතික පරීක්ෂණවේදී ඒ දක්වා ආක්‍රමණය ඉවත් කර නොතිබුණු අතර, විගණනයේදී තානායමේ ආරක්ෂාව සහතික කළ නොහැකි බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | ආක්‍රමණය ඉවත් කර තානායමේ ආරක්ෂාව තහවුරු කළ යුතු අතර තානායම නිසි ලෙස බදු දීමට හෝ ඵලදායී ලෙස ලාභදායී ආකාරයෙන් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

## 3.7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දුන්හිඳ ව්‍යාපෘතිය යටතේ රු.7,488,133 ක වියදමින් 2017 පෙබරවාරි 01 සිට 2017 දෙසැම්බර් 15 දක්වා කාලය තුළ පරිසර හිතකාමී වෙළෙඳ කුටි 20 ක්, කඩයකට බංකු 02 ක්, ආරක්ෂිත වැටක් සහ නාම පුවරුවක් ඉදිකිරීමට අධිකාරිය සැලසුම් කර තිබුණි. 2018 ජනවාරි 22 වන විට රු.2,864,289 ක වියදමින් කුටි 10 ක් සහ නාමපුවරුවක් පමණක් ඉදිකර තිබුණු අතර ඉදිකිරීම් අත්හැර දමා තිබුණි. නැවතත් එම ව්‍යාපෘතිය යටතේම 2021 වසරේදී තවත් කුටි 5 ක් ඉදිකිරීමට අධිකාරිය තීරණය කර රු.2,350,000 ක මුදලක් ගෙවා තිබුණද මුල් සැලැස්මේ කාමර 5 ක් ඉදිකිරීම අත්හැර දමා තිබුණි. වසර 4 ක ප්‍රමාදය හේතුවෙන් එක් කාමරයක වියදම රු.272,429 සිට රු.470,000 දක්වා ඉහළ ගොස් තිබුණු අතර මුළු වියදම රු.987,855 කින් වැඩි වී තිබුණි. | සොරණාතොට ප්‍රාදේශිය සභාවේ මුදල් නොමැතිකම නිසා, සම්පූර්ණ ව්‍යාපෘතිය කඩ 10 ක් ඉදි කිරීමෙන් පසු නැවැත්විණි. ඉන්පසුව කොවිඩ් 19 වසංගතයත් සමඟ වසරකට වැඩි කාලයක් එම වැඩකටයුතු නතර විය. පසුව ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ඉතිරි කටයුතු සිදුකිරීමට ඌව පළාත් සභාව එකඟ විය. ඩොලර් හිඟකම හේතුවෙන් සියලුම ආනයනික භාණ්ඩ හා දේශීය වෙළෙඳපොළේ ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා කාමරයක මිල ඉහළ ගොස් තිබිණි. | ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කළ යුතු අතර පිරිවැය ඵලදායි ලෙස සිදු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් යාල පිවිසුම් දොරටුව සහ නිවාඩු නිකේතන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2021 ජනවාරි 01 දින රු.55,000,000 ක මුදලකට ලබා දී ඇති කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. | 2022 ආර්ථික අර්බුදයෙන් පසු සියලුම ප්‍රාග්ධන ව්‍යාපෘති රජය විසින් අත්හිටුවන ලද බැවින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දමන ලදී. 2024 දී ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටින අතර පිවිසුම් දොරටුව ප්‍රථමයෙන් ඉදි කිරීමට බලාපොරොත්තු වේ. පිවිසුම් දොරටුවට පසුව කාර්යාල ගොඩනැගිල්ල 2025 දී ඉදිකිරීමට සැලසුම් කර ඇත. | ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව පසු විපරම් කර ඵලදායී ලෙස නිම කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | අනුරාධපුර ජාතික නිවාඩු නිකේතනය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලංසු ඇගයීම මාස 07 ක් ප්‍රමාද වීම සහ වසරකට වැඩි කාලයක් වැඩ නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් දීර්ඝ කාලයක් ගත වී තිබුණි. මෙම ප්‍රතිසංස්කරණය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු.81,505,926 ක් වැය වී තිබුණි. මෙම නිවාඩු නිකේතනය භෞතික පරීක්ෂාවේදී රියදුරන්ගේ නවාතැනෙහි බිත්තිවල යම් යම් ඉරිතැලීම් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව පසු විපරම් කර ඵලදායී ලෙස නිම කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2023 ජනවාරි 12 දිනැති ලිපිය මගින් වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකු 2023 මාර්තු 30 දින සිට නැවත සේවයේ පිහිටුවා තිබූ අතර, චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයකට යටත්ව මණ්ඩලයේ තීරණයකට අනුව සම්පූර්ණ හිඟ වැටුප් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් විධිමත් විනය පරීක්ෂණය අද දක්වා අවසන් වී නොතිබුණි. | විධිමත් විනය පරීක්ෂණය සම්බන්ධයෙන් ගෙන ඇති තත්ත්වයන් සහ ක්‍රියාමාර්ග සලකා බැලීමේදී විධිමත් ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමේ අවශ්‍යතා හේතුවෙන් පරීක්ෂණය තවමත් අවසන් කර නොමැති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත්, පරීක්ෂණය නිසියාකාරව අවසන් කිරීම සහතික කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම කඩිනමින් සහ නිවැරදිව ක්‍රියා කර ඇත. | විනය පරීක්ෂණය ඉක්මනින් අවසන් කළ යුතුය. |